අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/05/02 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024.05.15

චක්‍රලේඛ අංක - 20/2024

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වීමෙන් පසුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම**

2023 වර්ෂයට අදාළ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පවත්වා අවසන් කර ඇති බැවින්, එම විභාග ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාව දක්වා වන කාල සීමාව තුළ සිසු සිසුවියන් පාසල් අධ්‍යාපනයෙන් බැහැර වීම හේතුවෙන් අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා යොමු වීමේ අඩු ප්‍රවණතාවක් ඇතිවන අතර එමගින් විවිධ සමාජ ගැටලු නිර්මාණය වීමට ද හැකියාවක් පවතී. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන්ව අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භය දක්වා මාස කිහිපයක කාල සීමාවක් පැවතීම මත සිසු සිසුවියන් හා පාසල අතර සබඳතාවයට සෘණාත්මක බලපෑමක් ඇති වේ. එමෙන් ම, සිසු සිසුවියන්ට අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය නියමිත කාලයට පෙර අවසන් කිරීමට ද හැකියාවක් නොලැබී යාම ගැටලුවකි. ඒ අනුව, එම කාලය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම හා අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශ ආවරණය සඳහා ගතවන කාලය අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කාලීන අවශ්‍යතාවක් වේ.

ඒ අනුව, අමප අංක 24/0846/607/084 හා 2024.05.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසු සිසුවියන් සඳහා නොපමාව අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. එය නියමු වැඩසටහනක් ලෙස මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ලැබේ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) 2023 (2024) විභාගයට පෙනී සිටි සිසු සිසුවියන් සඳහා අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා ක්‍රියාත්මක වන සියලු ම පාසල්වල අ.පො.ස. (උසස් පෙළ) පන්ති 2024.06.04 වන දින ආරම්භ කිරීමට අදාළ ව, පහත උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි.

**1.0 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) – 2023 (2024) විභාගයට පෙනී සිටි සිසු සිසුවියන් පාසල්වලට තාවකාලිකව යොමු කිරීම / අනුයුක්ත කිරීම හා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම**

1.1 සිසු සිසුවියන් හැදෑරීමට අපේක්ෂා කරන අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා ක්‍රියාත්මක වන පාසල්වල සිසු සිසුවියන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි පාසලේ ම අ.පො.ස. (උසස් පෙළ) පන්තිවලට ඉල්ලුම්කරනු ලබන විෂයධාරාව සඳහා තාවකාලිකව යොමු කළ යුතු ය. (මෙය හුදෙක් තාවකාලික පදනම මත සිදු කරන අනුයුක්ත කිරීමක් බවට අදාළ සිසු සිසුවියන් හා දෙමාපියන් / භාරකරුවන් වෙත අවධාරණය කළ යුතු ය.)

1.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා පමණක් ක්‍රියාත්මක 2 වර්ගයේ පාසල් හා විද්‍යා විෂය ධාරාව නොමැති 1C වර්ගයේ හා තාක්ෂණ විෂය ධාරාව නොමැති 1 AB, 1C වර්ගයේ පාසල්වල සිසු සිසුවියන් අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ වන පාසල් පොකුර තුළ සුදුසු පාසල්වලට තාවකාලික පදනමින් අනුයුක්ත කිරීම සඳහා පළාත් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් කටයුතු කළ යුතු ය.

1.3 එහි දී, සිසු සිසුවියන් ඉල්ලුම්කරන විෂය ධාරාව ක්‍රියාත්මක නොවන පාසල්වල සිසු සිසුවියන්ට තම පාසල් පොකුර තුළ ද ඊට අදාළ පාසල් නොමැති නම්, එම පොකුරට යාබද පාසල් පොකුරකට අදාළ විෂය ධාරා සහිත පාසලකට තාවකාලිකව අනුයුක්ත කළ හැකි අතර එහි දී, ඉගෙනුම් මාධ්‍ය පිළිබඳව ද සැළකිලිමත් විය යුතු ය. ඉහත 1.1 , 1.2 හා 1.3 මඟින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් පළාත් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් සුදුසු පරිදි තීරණ ගත යුතු ය.

1.4 තාවකාලිකව අනුයුක්ත කරනු ලබන සිසු සිසුවියන්ගේ තොරතුරු සම්බන්ධ ගොනුවක් පාසල්වල නඩත්තු කළ යුතු අතර සිසු සිසුවියන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා තාවකාලිකව නාමලේඛනයක් භාවිත කළ යුතු ය.

1.5 තාවකාලිකව අනුයුක්ත කරනු ලබන පාසලේ සිසු සිසුවියන්ට අධ්‍යයන කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් පවතී ද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර, එවැනි ගැටලු පවතී නම්, පළාත් /කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඒ බව දැනුම් දිය යුතු ය.

1.6 ඉහත උපදෙස් පරිදි අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමෙන් අනතුරුව 12 ශ්‍රේණියට අදාළ විෂය නිර්දේශය ඉගැන්වීම කළ යුතු ය.

1.7 අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා තාවකාලික ව පාසල්වලට ඇතුළත් වන සිසු සිසුවියන්ගෙන් පහසුකම් හා සේවා ගාස්තු අය නොකළ යුතු අතර, තාවකාලිකව අනුයුක්ත කරනු ලබන පාසලේ නිල ඇඳුම, එසේ ඇතුළත් වන සිසු සිසුවියන්ට අදාළ කර නොගත යුතු ය.

1.8 අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා තාවකාලිකව අනුයුක්ත වන සිසු සිසුවියන් සඳහා එම සිසු සිසුවියන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉගෙනුම ලැබූ පාසල්වලින් ශිෂ්‍ය කාර්ය දර්ශන නිකුත් නොකළ යුතු ය.

**2.0 සිසු සිසුවියන් තාවකාලිකව පාසල්වලට යොමු කිරීමේ දී / අනුයුක්ත කිරීමේ දී අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාව තෝරා ගැනීම**

2.1 සියලු ම සිසු සිසුවියන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වූ පසු තම පාසල්වල විදුහල්පතිවරුන් හමු වී අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා තෝරා ගනු ලබන විෂය ධාරා සම්බන්ධයෙන් අදාළ උපදෙස් ලබා ගත යුතු බවට දැනුවත් කළ යුතු ය.

2.2 සිසු සිසුවියන් විෂය ධාරා සඳහා තෝරා ගැනීමේ දී සාධන මට්ටම පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් පවතී නම් එම සිසුන්ගේ 10 හා 11 ශ්‍රේණිවල සාධන මට්ටම සලකා බැලිය හැකි ය. අවශ්‍යතාව අනුව සිසු සිසුවියන්ගේ සාධන මට්ටම පිළිබඳ අදාළ පාසල්වල විදුහල්පතිවරුන් විසින් පළාත් / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නිර්දේශ කරන ලද ලිපියක් / සිසු සිසුවියන්ගේ නාම ලේඛනයක් ලබා දිය යුතු ය.

**3.0 නියමිත පරිදි අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම**

3.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු 2008.04.30 දිනැති අංක 2008/17 දරන චක්‍රලේඛය අනුව සිසු සිසුවියන් ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති සහිත පාසල්වල නියමිත පරිදි අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු අදාළ ප්‍රතිඵල අනුව සිසු සිසුවියන්ට තමන්ගේ අභිමතය පරිදි පාසල් ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබාදිය යුතු ය.

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්